(03) 00556

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීති වේදී උපාධි පාඨමාලාව - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/18

පරිසර නීතිය – **LWU3314/LLU5811**

කාලය - පැය (03) තුනයි

................................................................................................................................

දිනය : 2020 පෙබරවාරි 28 වේලාව : ප.ව. 2.00 ප.ව. 5.00

................................................................................................................................

මුළු ප්‍රශ්න ගණන 07 යි

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ

ප්‍රශ්න 04 (හතරකට) පමණක් පිළිතුරු සපයන්න

**01.** ඩ්‍රීම්ලන්ඩ් යනු සංවර්ධනය වෙමින් පවත්නා රටක් වන අතර එරට ආණ්ඩුව ඉදිරි වසර 10 ක කාලය තුළ සංවර්ධිත රටක තත්වයට ළඟා වීමට අපේක්ෂා කරයි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා ඩ්‍රීම්ලන්ඩ් ආණ්ඩුව එහි ප්‍රධාන නගරය වන රාජ්පුර තුළ සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් ආරම්භ කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ව්‍යාපෘතීන් තුළින් උත්පාදනය වන රැකියා අවස්ථාවන් හේතුවෙන් රටේ අනෙකුත් ප්‍රදේශවලින් විශාල පිරිසක් ප්‍රධාන නගරය වෙත සංක්‍රමණය විය. නගරයේ ජනගහනය ඉක්මවා යාම, වාහන තදබදය, ඩීසල් උත්පාදන යන්ත්‍ර වලින් පිටවන වායූන්, ඉදිකිරීම් පරිශ්‍රයන්ගෙන් පිටවන දූවිලි, කැළිකසළ දහනය සහ නීති විරෝධී කාර්මික කටයුතු හේතුවෙන් රාජ්පුර වායුවේ ගුණාත්මකභාවය අනතුරුදායක ලෙස පහතට වැටුණි.

මෑත කලීනව, රාජ්පුර, පරිසර දූෂණය සම්බන්ධව වාර්තාගත ලෙස දූෂිතම කාල පරිච්ඡේදය සනිටුහන් කරන ලද අතර එහිදී පුද්ගලයන්ගේ පෙනීම සීමා කරන දුඹුරු පැහැ දුමක් සහ ඇස් දැවිල්ලක් ඇති වන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සෞඛ්‍ය සම්පන්න යැයි සළකන සීමාවට වඩා දස ගුණයකින් වැඩි ලෙස වායු අංශූන් මඟින් වායුවේ ගුණාත්මක දර්ශකය වාර්තා වී ඇත. ව්‍යායාම කිරීම හෝ එළිමහන් ක්‍රියාකාරකම්වලදී දහස් ගණන් මිනිසුන් ශ්වසනාබාධ සහ හුස්ම ගැනීමේ අපහසුතාවන්ගෙන් පෙළන බවටත්, සමේ ආසාදන තත්වයන් නිසා ළමුන් රෝහල්ගත කර ඇති බවටත් වාර්තා වී ඇත. ඩ්‍රීම්ලන්ඩ් හි දේශීය පුවත්පතක් විසින් කළ සමීක්ෂණයකට අනුව, රාජ්පුර දරුවන් 34 දෙනෙක් වාතයේ ගුණාත්මකභාවය පහත වැටීම නිසා පෙනහළු වලට හානි වීම හේතුවෙන් දැනට රෝහල් තුළ ප්‍රතිකාර ලබන බව වාර්තා කරයි. එය තවදුරටත් පෙන්වා දෙන්නේ මෙම තත්වය දරුවන්ගේ ප්‍රතිශක්තිකරණය පහත හෙළීම සහ පිළිකා ඇති වීමේ අවධානම ඉහළ නංවන බවයි.

වායු දූෂණය පාලනය කිරීමට අපොහොසත් වීම සහ පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් රජයට සහ අදාළ අධිකාරීන්ට විරුද්ධව නඩුවක් පැවරීමට වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමයේ රාජ්පුර ශාඛාව අදහස් කරයි.

බ්‍රීම්ලන්ඩ් හි නීතිය සහ නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරන්න. මහජන සුභසාධක නඩුකරයක් වශයෙන් මෙම නඩුව සාර්ථකව පැවරිය හැකිදැයි වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමයට උපදෙස් දෙන්න. (ලකුණු 25)

**02.** පහත ප්‍රකාශ සළකා බලා ඒවා සම්බන්ධයෙන් නඩු තීරණවලදී විනිසුරුවරුන් කටයුතු කර ඇති ආකාරය සාකච්ඡා කරන්න. ඔබේ සාකච්ඡාව ව්‍යවස්ථාපිත නීතියේ අදාළ ප්‍රතිපාදන සහ නඩු නීතිය මඟින් තහවුරු කළ යුතුය. ශ්‍රී ලංකාවේ සහ වෙනත් අධිකරණ බලයන්ගේ උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර පැහැදිලි කළ යුතුය.

**i.** 'සංවර්ධන ව්‍යාපෘතීන් මඟින් භෞතික පරිසරයට පමණක් නොව සමාජයට සහ ප්‍රජාවටද බලපෑම් ඇති කෙරේ.' (ලකුණු 12.5)

**ii.** 'සංවර්ධනය සහ පරිසර විද්‍යාව එකිනෙකට පටහැනිව යන සම්ප්‍රදායානුකූල සංකල්පය යැයි තවදුරටත් පිළිගත නොහැක.' (ලකුණු 12.5)

**03.** පහත සඳහන් නඩුතීරණ වලදී තහවුරු කළ නෛතික මූලධර්ම හා සංකල්ප පැහැදිලි කරන්න

අ) *Juwan Anthonio Oposa and ohers v. The Hounourable Fulgencio S Factoran and another* (1994) Vol.1 (3) SAELR 113

ආ) *M M Khalid and Three Others v. Chairman, Sri Jayawardenepura- Kotte Urban Council* (1996) Vol.3 (3) SAELR 62

ඇ) *M C Mehta v. Kamal Nath and Others* (1997) Vol.4(3) SAELR 122; (1997) 1SCC 388

ඈ) *Nair v. Costa* 28 N.L.R. 385

ඉ) *New Zealand v. France* (1996) Vol.3 (1&2) SAELR 7 (ලකුණු 05 x 5 = 25)

**04.** "... ජාතික පාරිසරික ප්‍රතිපත්ති සහ ස්වභාවික සම්පත් සංරක්ෂණයට අදාළ පර්යේෂණ සිදුකරමින් නිර්දේශ ඉදිරිපත් කිරීමේ සහ අදාළ පර්යේෂණ, අධ්‍යාපන සහ උපදේශන ක්‍රියාකාරකම්වල නිරත වීමේ බලතල, කාර්යයන් හා යුතුකම් සහිතව 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් මධ්‍යම පරිසර අධිකාරිය (CEA) පිහිටුවන ලදී. කෙසේ වෙතත්, පරිසර දූෂණය සහ හානිය ඵලදායී ලෙස පාලනය කිරීමට හෝ මිනිස් ක්‍රියාකාරකම් හරහා පරිසර දූෂණය කිරීම හෝ හානි කිරීම වැළැක්වීමට පනත මඟින් මධ්‍යම පරිසර අධිකාරියට බලතල හෝ යුතුකමක් ලබා දී නැත."

*Ravindra Gunawardena Kariyawasam, Chairman, Centre for Environment and Nature Studies Vs. Central Environment Authority and others, SC FR Application No. 141/ 2015, PG 12.*

මෙම තීන්දුව සමඟ ඔබ එකඟ වන්නේද? පාරිසරික දූෂණ ක්‍රියාකාරකම් පාලනය කිරීම සහ විධිමත් කිරීම සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 පනත් මගින් සංශෝධිත 1980 අංක 48 දරන ජාතික පාරිසරික පනතේ (NEA) ඵලදායීතාවය විවේචනාත්මකව අගයන්න. ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරින් තහවුරු කරන්න. පනතේ ඵලදායීතාවය වැඩිකිරීම සඳහා යෝජනා ද ඔබේ පිළිතුර තුළ ඇතුළත් කළ යුතුය.

(ලකුණු 25)

**05.** ලෝකයේ ආයෝජනයට වඩාත් හිතකර රාජ්‍යක් වශයෙන් ලැයිස්තු ගත කර ඇති මව්ලංකා සංවර්ධනය වෙමින් පවත්නා රටකි. සංවර්ධිත රටක් පදනම් කොට බිහි වූ විශාල ආයෝජන සමාගමක් වන Big Brother Resource Partners සමාගම, මව්ලංකාහි මධ්‍යම පළාතේ පිහිටා ඇති සෞභාග්‍යාහි ඇපටයිට් භාවිත කරමින්, පොස්පේට් පොහොර නිෂ්පාදනය කිරීමේ ඒකාබද්ධ ව්‍යාපාරයකට ආයෝජනය කිරීමට තීරණය කර ඇත. මව් ලංකාහි පෞරාණික දෙවන අගනගරය වශයෙන් භාවිත වූ සෞභාග්‍ය, ස්වභාවික සම්පත් වලින් පොහොසත් නගරයකි. එය මව්ලංකාහි පැරණි ශිෂ්ටාචාරයේ ආරම්භක ස්ථානය වශයෙන්ද පිළිගැනෙන අතර මූලිකව එහි ජනතාව පැරණි කැටයම් කර්මාන්තය රැකියාව කර ගනිමින් සාමකාමී ජීවිතයක් ගත කරයි.

Big Brothers Resources Partners, ව්‍යාපෘතිය මාස 8ක් තුළ සම්පූර්ණ කිරීමට තීරණය කර ඇති අතර නිර්දේශිත පටිපාටිය අනුගමනය නොකර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මව්ලංකා සමග කථිකාකරගෙන ඇත.

මව්ලංකාහි පුවත්පත්, ලිපි පළකරමින් Big Brothers Resources Partners සමඟ වන මෙම ඛනිජ ද්‍රව්‍ය පිළිබඳ ආයෝජන ගිවිසුම, මව්ලංකාව සංවර්ධනයේ ඉදිරි පියවරකට ගෙනයන බව පූර්වානුමානය කරයි. මෑතකදී, පුරාවිද්‍යා දෙපාර්තමේනතුව සෞභාග්‍යාහි සිදුකරන ලද පුරාවිද්‍යාත්මක පර්යේෂණයක් අනුව කැණීම් පරිශ්‍රයක් සොයාගෙන ඇති අතර "සෞභාග්‍යා - ලෝකයේ පැරණිතම නාගරික පරිශ්‍රයන්ගෙන් එකක්" යන මාතෘකාව යටතේ එහි වාර්තාව ඉදිරිපත් කර ඇත.

Barefoot Lawyers' නම් වූ මව්ලංකාහි නීති ශිෂ්‍ය ක්‍රියාකාරි කණ්ඩායමක් මෙම ආයෝජන ව්‍යාපෘතිය මව්ලංකාහි ආණ්ඩුව විසින් අනුමත කිරීම නැවැත්වීමට අදහස් කරන අතර ඒ සඳහා ඔබේ උපදෙස් විමසයි. මව්ලංකාහි නීති පද්ධතිය ලංකාවේ නීති පද්ධතියට සමාන යැයි උපකල්පනය කරමින් ඔවුන්ට උපදෙස් දෙන්න. (ලකුණු 25)

**06.** "අන්තර්ජාතික මට්ටමින් සහ ජාතික මට්ටමින් පරිසර ගැටලු සහ මානව හිමිකම් අතර පවත්නා අන්තර් සබඳතාවය හඳුනාගැනීම නඩු තීරණ නීතියේ වැදගත් වර්ධනයක් ඇති කිරීමට හේතු වී තිබේ. පාරිසරික ගැටලු පිළිබඳ නඩු පැවරීමට බොහෝ විට පදනම්ව ඇත්තේ ජාතික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපාදන මතය. අනෙක් අතට, බොහෝ මානව හිමිකම් නඩු වලදී, පාරිසරික ප්‍රමිතීන් සැකසීම සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමට කටයුතු කර ඇත."

ශ්‍රී ලංකාවේ අධිකරණ සහ වෙනත් රටවල තීරණය කරන ලද නඩු තීරණ උදාහරණ වශයෙන් දක්වමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 25)

**07.** සමඟි මාවත යනු සතුටුපුර පිහිටි නිවාස 30 කින් සමන්විත නේවාසික වීථියකි. බාලා සහ රුමින්ද සමඟි මාවතේ යාබද නිවාසයන්හි සිටින අසල්වැසියන් දෙදෙනෙකි. අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීමකින් තොරව රුමින්දගේ නිවසට යාබදව බාලා කුකුළු ගොවිපළක් ආරම්භ කරන ලදී. වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වන රුමින්ද, ඔහුගේ නිවසේ පිහිටි පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයෙන් අසල්වැසියන්ට නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයයි. ඔහුගේ පවුලේ අයට සහ රෝගීන් යන දෙපිරිසටම, බාලාගේ ගොවිපලේ කුකුලන්ගේ කෑගසන ශබ්දයත් ඉන් හමන දුර්ගන්ධයත් ඉවසිය නොහැකි කරදරයක් බව රුමින්දට පෙනී යන ලදී.

කුකුළු ගොවිපළ පැවතීම කරදරයක් පමණක් නොව කුකුළු ගොවිපළෙන් පැමිණෙන දුර්ගන්ධය හුස්ම ගැනීමේ අපහසුතාවන් ඇති කිරීමටද හේතුවක් වන බව සමඟි මාවතේ පදිංචිකරුවන්ට වැටහෙන ලදී. රුමින්දගේ කුඩා දියණිය වන සාරා විශේෂයෙන් ඉන් බලපෑමට ලක් විය. සමඟි මාවතේ ජීවත් වන විශ්වවිද්‍යාල ශිෂ්‍යකු වන විරාජ්, මෙම කුකුළු ගොවිපලෙන් එන ඇමෝනියා වායු තත්වය නිසා දුර්ගන්ධය ඇති වන බවත් එය දිගුකාලීනව පැවතුනහොත් ශ්වසනාබාධ ඇති වීමට හේතුවක් බවත් ප්‍රකාශ කරයි.

මෙම තත්වය සම්බන්ධයෙන් රුමින්දට සහ සමඟි මාවතේ පදිංචිකරුවන්ට පවතින ප්‍රතිකර්ම සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර තුළ නඩු තීරණ දැක්විය යුතුය. (ලකුණු 25)

**** *හිමිකම් ඇවිරිණි* ****